දරුවන් උදෙසා
බයිබලයක්

# යෙසායා - අනාගතය දුටු මිනිසා



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Jonathan Hay
Alastair Paterson

සකස්කරන්නා: Mary-Anne S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

යෙසායා අනාගතවක්තෘ වරයෙකු වූයේය. ඔහුගේ කාර්යය වූයේ දෙවියන් වහන්සේ පැවසූ දේ මිනිසුන්ට පැවසීමය. මිනිසුන්ට සෑම විටම දෙවියන් වහන්සේගේ වචනය ඇසීමට අවශ්‍ය නොවීය.



නමුත් යෙසායා කිසි විටෙකත් දෙවියන් වහන්සේව පහත් නොකළේය. යෙසායා විවිධ රජවරුන් හතර දෙනෙකුගේ පාලන සමයේදී දේශනා කළේය.



උස්සියා රජ ජුදා දේශය පාලනය කළේ යෙරුසලම් නගරයේ හිඳිමින්ය. මුලදී, දෙවියන් වහන්සේ උස්සියාට ආශීර්වාද කළේ ඔහු ස්වාමින් වහන්සේ ඉදිරියෙහි හරි දේ කළ බැවිනි. නමුත් උස්සියා උඩඟු වී දෙවියන් වහන්සේට කීකරු වීම නතර කළේය. ලාදුරු රෝගියෙකු බවට පත් වී මිය යන තුරුම ඔහුට තනිව ජීවත් වීමට සිදු විය.



උස්සියා රජ අවුරුදු 60කට වැඩි කාලයක් රජකම් කළේය. ඔහු මිය ගිය පසු ඔහුගේ පුත් යෝතාම් ඔහු වෙනුවට අවුරුදු දාහතක් රජකම් කළේය. දෙවියන් වහන්සේ යෝතාම්ට ආශීර්වාද කළේ යෙසායා සහ අනෙකුත් අනාගතවක්තෘවරුන් මාර්ගයෙන් දෙවියන් වහන්සේ පැවසූ දේට ඔහු සවන් දුන් බැවිනි.



යෝතාම් රජුගේ පුත්‍රයා ආහාස් ය. ආහාස් රජකමට පත් වන විට වයස අවුරුදු විස්සක් වූ අතර ඔහු යෙරුසලමෙහි දහසය අවුරුද්දක් රජකම් කළේය. ආහාස් දෙවියන් වහන්සේ ගැන නොතැකුවේය. ඔහු පිළිමවලට හා බොරු දෙවිවරුන්ට නමස්කාර කළ අතර දෙවියන් වහන්සේගේ සෙනඟගෙන් බොහෝ දෙනෙකුටද එසේ කිරීමට මඟ සැලසුවේය. යෙසායා ඔහුට අවවාද කළත් ආහාස් දෙවියන් වහන්සේගේ අනතුරු ඇඟවීම්වලට සවන් දුන්නේ නැත. ඔහු වයස අවුරුදු 35 දී මිය ගියේය.





සියලු පිළිම හා බොරු දෙවිවරුන් ඉවත් කර සැබෑ දෙවියන්ට යාච්ඤා කළ බැවින් ජුදාහි රජවූ හෙසකියාට දෙවියන් වහන්සේ ආශීර්වාද කළ සේක. සතුරු හමුදාවක් යුදයාවට පහර දුන් විට, තම හමුදාව ජයග්‍රහණය කිරීමට නොහැකි තරම් දුර්වල බව හෙසකියා දැන සිටියේය. දෙවියන් වහන්සේගේ උපකාරය පතා යාච්ඤා කරන ලෙස ඔහු යෙසායාගෙන් ඉල්ලා සිටියේය.

යෙසායා මෙම පණිවිඩය රජුට යැවීය. "දෙවියන් වහන්සේ පවසන්නේ මෙයයි: මේ සතුරාට බිය නොවන්න ... මම ඔහුව වැටෙන්න සලස්වන්නෙමි ..." වැඩි කල් යන්නට මත්තෙන්, දෙවියන් වහන්සේ සතුරු හමුදාව හෙසකියා සමඟ සටන් නොකරම යන්නට සැලැස්වූ සේක.



ඔහු වටා සිටි මිනිසුන් දෙවියන් වහන්සේ ගැන එතරම් නොසිතුවද, යෙසායා උන් වහන්සේ ගැන බොහෝ දේ සිතුවේය.



දිනක් ඔහුට දර්ශනයක් පෙනුණි. එය ඔබ නිදි නැතිව හිඳිද්දි දකින සිහිනයක් වැනිවූ දර්ශනයකි. ස්වාමින් වහන්සේ කොතරම් තේජාන්විතද හා ශුද්ධවන්තද යන වග යෙසායා දර්ශනයෙන් දුටුවේය.

“කවරෙක් යවන්නද?” දෙවියන් වහන්සේ දර්ශනය තුළින් ඇසූ සේක. “මම සිටිමි. මා යවනු මැනැවැ”යි යෙසායා පිළිතුරු දුන්නේය. දෙවියන් වහන්සේ ඉල්ලන ඕනෑම දෙයක් කිරීමටත්, දෙවියන් වහන්සේ ඔහුව යැවූ ඕනෑම තැනකට යාමටත් ඔහු කැමැත්තෙන් සිටියේය.





ඇතැම්විට දෙවියන් වහන්සේ ඔහුව උන්වහන්සේ ගැන අසා නැති දුර බැහැර මිනිසුන් වෙත යවාවි කියා යෙසායා සිතුවා විය හැකිය. නමුත් දෙවියන් වහන්සේ එසේ නොකළ සේක. දෙවියන් වහන්සේ යෙසායාට ඔහුගේම රටේ ඔහුගේම සෙනඟ සමඟ කතා කරන්නට කීසේක.

ඔවුන්ගේ පාපය ගැන දෙවියන් වහන්සේ කෝ්ප වූ බව ඔවුන්ට පැවසීමට යෙසායාට සිදු විය.



යෙසායාට තම සෙනඟට පැවසීමට තවත් දේවල් තිබුණි. ශක්තිමත් ගැලවුම්කරුවෙකු, පාපයෙන්ද ඔවුන්ගේ සියලු සතුරන්ගෙන්ද ඔවුන් ගළවා ගැනීමට පැමිණෙන පුද්ගලයෙකු පිළිබඳ අපූරු දේ ඒ අතර විය. යුදෙව් ජනතාව එතුමාණන්ව "මෙසියස්" ලෙස හැඳින්වූවෝය.



දෙවියන් වහන්සේ මෙසියස් එවන බව ඔවුන් අපේක්ෂා කළත්, බොහෝ අය ජීවත් වූයේ එතුමන් කිසිදා නොඑනා සේ සිතමිනි.




යෙසායා
මෙසියස්
වහන්සේ ගැන
පැවසූ සියලු දේ
ඔහුගේ පොතේ
ලියා ඇත. ඔහු
මේ දේවල් ලිව්වේ
ඒවා සිදුවීමට
වසර සිය
ගණනකට පෙර
වුවද, මෙසියස්
ගැන යෙසායා
පැවසූ සියල්ල
සැබෑ වනු ඇත.

දෙවියන් වහන්සේම ලකුණක් දෙන
බව යෙසායා පැවසීය. “මෙන්න,
කන්‍යාවක් පුත්‍රයෙකු
බිහිකර ඔහුට



එම්මානුවෙල් යන නම
තබන්නීය”යි ඔහු කීවේය. යෙසායා
දෙවියන් වහන්සේගේ මෙසියස්
ගැන කතා කරන බව මිනිසුන්
දැන සිටියේ කාන්තාවකට
කන්‍යාවක්ව සිටින
අතරම දරුවෙකු
ලැබීමට නොහැකි
බැවිනි. තවද,



එම්මානුවෙල් යන නමේ
තේරුම “දෙවියන් වහන්සේ
අප සමඟය” යනුයි.



“අපට දරුවෙක් උපන්නේය, අපට
පුත්‍රයෙක් දෙන ලද්දේය, රජයද
උන්වහන්සේගේ කර පිට ඇත්තේය,
උන්වහන්සේගේ නාමය
ආශ්චර්යවත්ය, උපදේශකයාණෝය,
බලසම්පන්න දෙවියන් වහන්සේය,
සදාකාලික පියතුමාණෝය,
සමාදානයේ කුමාරයා යයි කියනු
ලබන්නේය”. දෙවියන් වහන්සේගේ
පොරොන්දු ඉටු වන බව යෙසායා
කොතරම් විශ්වාස කළාද යත්, ඔහු
කතා කළේ සිද්ධිය දැනටමත් සිදුවී
ඇති ආකාරයටය. අනාවැකිය නම්
එවැනි දෙයකි!

මෙසියස් ශ්‍රේෂ්ඨ වන බවත් ශ්‍රේෂ්ඨ දේ කරන බවත් යෙසායා පැවසුවේය. දෙවියන් වහන්සේ යෙසායාට මෙසියස් දුක් විඳින්න සලස්වා මරණයට පත් කරන බව මිනිසුන්ට පවසන ලෙස කීසේක. මෙසියස් ශ්‍රේෂ්ඨ හා බලවත් වනවා මෙන්ම දුර්වලවී තුවාල වන්නේ කෙසේදැයි යෙසායා කල්පනා කරන්නට ඇත. නමුත් යෙසායා දෙවියන් වහන්සේ සමඟ වාද කළේ නැත - ඔහු දෙවියන් වහන්සේ ඔහුට පැවසීමට කී දේ එලෙසින්ම කීවේය. දෙවියන් වහන්සේ ඔහුගේ අනාවැකිය සැබෑ වන බවට සහතික වනු ඇත.



මෙසියස් පැමිණෙමින් සිටියේ යුදෙව් ජනතාව වෙනුවෙන් පමණක් නොවේ. දෙවියන් වහන්සේ යෙසායාට පැවසුවේ මෙසියස් "විජාතීන්ට ආලෝකයක්" වන බවය. විජාතිකයන් යනු යුදෙව්වන් නොවන ලෝකයේ අන් සියලුම ජාතීන්ය. දෙවියන් වහන්සේ සෑම කෙනෙකුටම ප්‍රේම කරන අතර උන්වහන්සේගේ මෙසියස් සෑම කෙනෙකුටම ආශීර්වාද කිරීමටත් පෘථිවියේ කෙළවරවල් දක්වා ගැළවීම ගෙන ඒමටත් වඩින සේක.



යෙසායා - අනාගතය දුටු මිනිසා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

යෙසායා 1, 6, 7, 9, 53

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)